


# ලෝකය රත්වෙයි !

සිරිල් අභයගුණවර්ධන

*කල්ප විනාශය සිදුවී හමාර ය. අප දැන් සිටින්නේ එහි සුන්බුන් අතර ය... යි සම්භාවනීය ඉංග්‍රීසි නවකතාකරුවකු වූ ඩී.එච්.ලෝරන්ස්, ඔහුගේ ආන්දෝලනාත්මක නවකතාව වූ "LADY CHATTERLY'S LOVER" හි සඳහන් කළේ, එකල එංගලන්ත ජනසමාජයේ පැවැති සදාචාරාත්මක විපර්යාසය ගැන යි.*

මතුපිටින් ගරු ගාම්භීර තත්ත්වයක් පෙන්නුම් කළ ද ඇතුළතින් ඔඩු දුවන තුවාලයක් බඳු වූ එදා පැවැති 'වික්ටෝරියානු කුහක සංස්කෘතිය ලෝරන්ස් දුටුවේ කල්පවිනාශයක් ලෙසිනි. "චැටර්ලි ආර්යාවගේ පෙම්වතා" නමැති ඉහත නවකතාව ලියා පළ කරැවීමට ඔහු පෙළැඹුණේ, එකී ගාම්භීර සමාජයේ අභ්‍යන්තර යථාර්ථයෙහි පැවැති ජුගුප්සා ජනක තත්ත්වය හෙළිදරව් කිරීම සඳහා ය. එහෙත් මෙකල අප අත්දකිමින් සිටින කල්පවිනාශය සැබැවින් ම ලෝකයේ සිදුවෙමින් පවතින භෞතික විපර්යාසය යි. වර්තමාන විද්‍යාඥයන් "පෘථිවිය උණුසුම්වීම"(GLOBAL WARMING) යනුවෙන් හඳුන්වන්නේ, එකී කල්පවිනාශයට මඟ පාදන අවදානම් ප්‍රපංචයක් හැටියට යි.

පෘථිවිය උණුසුම්වීම යනු එය මතුපිට වාතයේ සහ එය ආසන්න වායුගෝලයේ සාමාන්‍ය උෂ්ණත්වය, අසාමාන්‍ය ලෙස ඉහළ යෑමයි. එබැවින් අප අත්දකිමින් සිටින්නේ බරපතළ දේශගුණික විපර්යාසයකට මිස, සාමාන්‍ය දේශගුණික වෙනස්වීමකට නොවේ. එහෙත් අවාසනාව වී ඇත්තේ තවමත් මේ පිළිබඳ පාලකයින් ගේ හා වගකිව යුත්තන් ගේ අවධානය ඒ කෙරෙහි යොමු නොවීමයි.

එය මුළු මහත් සත්ත්ව සන්හතියේ ම පැවැත්මට අනතුරක් විය හැකි තර්ජනයක් ලෙස ද සැලකේ.

පෘථිවිය උණුසුම්වීම යනු එය මතුපිට වාතයේ සහ එය ආසන්න වායුගෝලයේ සාමාන්‍ය උෂ්ණත්වය, අසාමාන්‍ය ලෙස ඉහළ යෑමයි. එබැවින් අප අත්දකිමින් සිටින්නේ බරපතළ දේශගුණික විපර්යාසයකට මිස, සාමාන්‍ය දේශගුණික වෙනස්වීමකට නොවේ. එහෙත් අවාසනාව වී ඇත්තේ තවමත් මේ පිළිබඳ පාලකයින් ගේ හා වගකිව යුත්තන් ගේ අවධානය ඒ කෙරෙහි යොමු නොවීමයි. එසේ වගකීමෙන් යුතුව කටයුතු කරනවා වෙනුවට එවැනි බොහෝ දෙනෙක්, එකී අනතුර හෙළිදරව්වු කරන ටික දෙනාට එරෙහිව සංවිධානාත්මකව කටයුතු කර, ඔවුන් දුර්මුඛ කිරීමටත් ඔවුන්ගේ ප්‍රචාරක කටයුතු සමච්චලයට ලක්කිරීමටත් උත්සාහ කරති.

එදා බ්‍රිතාන්‍යයේ සුචරිතවාදීන් ඩී.එච්. ලොරන්ස්ට අසභ්‍යවාදයෙන් දමාගසා ඔහු උසාවි ගානේ රස්තියාදු කැරැවීමට කටයුතු කළ ආකාරයෙන් ම ;මදා ඇමරිකාවේ විශාල කර්මාන්ත ව්‍යාපාරහිමියන්ගේ සුරතලුන් වී සිටින විවිධ සංවිධානවල ප්‍රමුඛයෝ, පෘථිවිය උණුසුම්වීම පිළිබඳ අනතුර ලොවට හඬනඟා කියන ඇල්ගෝර් (ALGORE) වැන්නන් බොරු ප්‍රචාරයක් ගෙනයන වංචාකාරයන් ලෙස හංවඩු ගසා ඔවුන්ගේ සද්ව්‍යාපාරය අඩපණකිරීමට ඩොලර් මිලියන ගණන් වියදම් කරති' එහෙත් ලොව පුරා ඇස්පනාපිට සිදුවන ස්වාභාවික ව්‍යසන බොහෝමයකට පාදක වී තිබෙන්නේ පෘථිවියේ උණුසුම්වීම බව පිළිගැනීමට තරම් තත්ත්වය මෝරා වැඩී තිබේ. එබැවින් එය අප්‍රසන්න සත්‍යයක්වීම වැළැක්විය නොහැකි ය.

## අපේ ග්‍රහලෝකයේ හදිසි තත්ත්වයක් !

අප අද මුහුණදී සිටින දේශගුණික විපර්යාසය හෙමින් සිදුවන දෙයක් යැයි බොහෝ අය සිතති. එහෙත් ඇත්ත තත්ත්වය එය නොවේ. අපේ පියවි දෑසට නොපෙනුන ද පියවි සිරුරට නොදැනුන ද එය ඉතා වේගයෙන් ක්‍රියාත්මක වන්නක් බව විද්‍යාඥයෝ හඳුනාගෙන සිටිති. එබැවින් අප මේ තත්ත්වය හොඳින් දැන, එය අන්තරායකාරී අර්බුදයක් ලෙස සලකා, ඊට නිසි පිළියම් යෙදීමට ක්‍රියාත්මක නොවුවහොත් එහි ප්‍රතිඵලය වඩාත් භයානක වනු ඇත.

මේ අනුව පෘථිවිය උණුසුම්වීම හේතුවෙන් හිමවලසා වැනි අන්තරායකාරී සතුන්ගේ වඳවීයෑම වැඩි වේ. මිලියන ගණනක ජනතාවට සිය සුපුරුදු ගේ දොර වතුපිටි අහිමි කරමින් ගංගා හා මුහුදු ජලය ගොඩබිම ආක්‍රමණය කරනු ඇත. ඊළඟට දැඩි නියං හා ලැව්ගිනි ද හටගනී. වඩා විනාශකාරී - ප්‍රබල කුණාටු හා සුළි සුළං නිරතුරුවම ඇති වේ. පෘථිවිය සඳහට ම වෙනස්වීමේ ආරම්භය, මෙලෙස කිසිවිටෙක නොසිදුවූ ආකාරයෙන් සිදු වේ.

ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු උප ජනාධිපතිවරයකු වන අල් ගෝර්(AL GORE) දීර්ඝකාලයක සිට ම පරිසරය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති, සැබෑ පරිසර හිතවේදියෙකි. ඔහු පරිසරයට ඇලුම් කරන්නට පටන් ගෙන ඇත්තේ ළමා කාලයේ සිට ය. වොෂින්ටනයේදී සෙනේට් සභිකයකු වූ ඔහු ගේ පියා, ටෙනසි මිටියාවතේදී හොඳ ගොවියකු වූයේ ය. මේ අනුව ඇල්ගෝර් ගේ ළමා කාලය නගරය හා ගම යන දෙපළාතේ ම ගෙවී ගිය එකක් විය. කොන්ක්‍රීට් වනාන්තරයක් බඳු වොෂිංටන් නගරයේ තට්ටු නිවසට වඩා ටෙන්සි මිටියාවතේ ගොවි ගෙදර (FARM HOUSE) ට ඔහු බෙහෙවින් ප්‍රිය කළේ ය. එහි දී ඔහු ගේ පියා ඔහුට පරිසරය පිළිබඳ මූලික කාරණා හැම දෙයක් ම උගන්වා ඇත. එහෙත් මිනිසාගෙන් මහපොළවට සිදුවන නොපනත්කම් හා එමඟින් ඊට සිදුවන හානි පිළිබඳ අල්ගෝර්ට මුලින් ම දැනගැනීමට ලැබුණේ සිය මව ගෙනි. ඔහු 14 වැනි වියේ පසුවෙද්දී ඔහුගේ අම්මා ඔහුට රචෙල් කාර්සන් ගේ "නිහඬ වසන්තය" (SILENT SPRING BY RACHEL CARSON) නමැති පොත කියවා තේරුම් කරදී ඇත. වර්තමාන මානව ශිෂ්ටාචාරය තුළ පරිසරයට බරපතල හානි පැමිණ විය හැකි ප්‍රවණතා ඇති බව එමඟින් ඇය ඔහුට හා ඔහුගේ සොහොයුරියට ඉගැන්නුවාය. ඔහු ඉතා ප්‍රියකළ ස්වාභාවික ලෝකය ගැඹුරු අනතුරකට මුහුණ දී සිටින බව 1968 සිය විදුහලේදී ද උගත්තේ ය. ඊට අමතරව හාර්වර්ඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය රොගර් රැවෙල් විසින් පෘථිවිය උණුසුම්වීමේ ක්‍රියාවලිය පිළිබඳ ඇල්ගෝර් දැනුවත් කරන ලදී.

පෘථිවිය උණුසුම්වීම එතරම් බරපතළ කාරණයක් නොවේ යැයි බොහෝ අය සිතන නමුදු ඇත්තටම එය භයානක උවදුරක් බව නිසැකවම සිතට ගත යුතු වේ. පෘථිවියේ දේශගුණය වෙනස්වෙමින් පවතින බවත් එම වෙනස අප සිතනවාට වඩා බොහෝ වේගයෙන් සිදුවන බවත් විද්‍යාව මඟින් සනාථකර තිබේ. 2005 දී කත්‍රිනා නම් වූ ඉතා හානිකර දැඩි කුණාටුවකට ඇමරිකානු ජනතාව මුහුණ දුන් අතර, පසුගිය දිනවල ටෝර්නාඩෝ කුණාටුවෙන් ද ඔවුහු බැට කෑහ.

කෙසේවුවද පෘථිවියේ උණුසුම්වීම, අපට පාලනය කළ නොහැකි ස්වාභාවික බලවේගයන් මඟින් ඇති කෙරෙන්නක් නොවේ. කිසිම ආකාශ වස්තුවක් පෘථිවිය හා ගැටෙන්නේ නැත. එසේම පෘථිවිය සූර්යයාට ළංවන්නේ ද නැත. මේ අනුව ප්‍රශ්නයේ ප්‍රධාන හේතු කාරකය වී තිබෙන්නේ මනුෂ්‍ය ප්‍රජාවයි. එබැවින් පෘථිවිය ආරක්ෂාකර ගැනීමේ වගකීම පැවරෙන්නේ ද මිනිසාට ය.

අප සියලු දෙනාම ස්වාභාවධර්මයේ කොටස්කරුවෝ වෙති. එබැවින් එම සම්බන්ධතාව "අප" හා "එය" යනුවෙන් පරිබාහිරව හැඳින්විය නොහැකිය. මිනිසාගේ පැවැත්ම සඳහා ස්වභාවධර්මය සුරැකී තිබිය යුතු ය. ඒ අනුව ස්වභාවධර්මය රැක ගැනීම, මිනිසා සතු කාර්යභාරයකි.

පෘථිවිය උණුසුම්වීම අර්බුදයක් වුවද මිනිසාට එය වැළැක්විය හැකි ය. චීන භාෂාවේ දැක්වෙන පරිදි "අර්බුදයන්" සමඟ "අවස්ථාවක්" ද තිබේ. චීන භාෂාවේ මේ සඳහා අකුරු දෙකක් භාවිත වේ. ඉහත අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින්, ඇල්ගෝර්, ප්‍රස්තුත අර්බුදය විසැඳීමේ චේතනාවෙන්, ලෝක ජනතාව ද මේ පිළිබඳ දැනුවත් කිරීම සඳහා, ඉතා අගනා ග්‍රන්ථයක් රචනා කොට ප්‍රකාශයට පත්කර ඇති අතර, ඒ පිළිබඳ වාර්තා චිත්‍රපටයක් ද නිර්මාණය කර තිබේ. ඒ දෙකම හැඳින්වෙන්නේ, ❐

**An inconvenient truth the crisis of global warming යනුවෙනි.**

**"නවයුගයේ" මෙවර කවරයේ කතාව, එම පොත ඇසුරෙන් සකස්කරනු ලැබූවකි. මේ පිළිබඳ තවත් කවරයේ කතාවක් 2006 මැයි මාසයේ "නවයුගය" කලාපයේ ද පළ වී ඇත.**